ලංසු සඳහා ආරාධනය (Invitation for Bids)
(ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති)

දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් ව්‍යාපෘති 02 ක් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාලම් 03 ක් සංවර්ධනය කිරීම

දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් ව්‍යාපෘති 02 ක් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාලම් 03 ක් සංවර්ධනය කිරීම සඳහා දොළුව ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් සුදුසුකම්ලත් අසාඩු ලේඛනගත නොවූ ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන්ගෙන් ජාතික තරහකාරී ලංසු කැඳවීමේ ක්‍රමය (National Competitive Bidding) යටතේ මුද්‍රා නැබූ ලංසු ආරාධනා කරනු ලැබේ. ලංසු ඉදිරිපත් කිරීම හා භාර ගැනීමේ කොන්දේසි හා තොරතුරු පහත පරිදි ඉදිරිපත් කර ඇති බව කාරුණිකව සලකන්න.

1. අළුත්වැඩියා හා වැඩිදියුණු කාර්යයන් සඳහා ඇස්තමේන්තුගත මූලික පිරිවැය, අවශ්‍ය අවම සුදුසුකම්, ලංසු සුරක්ෂණයේ වටිනාකම, ලංසු සුරක්ෂණයේ වලංගු කාලය, ලංසු ලියවිලි ගාස්තු සහ කොන්ත්‍රාත් කාල සීමාව පහත සඳහන් කර ඇත.

අනු අංක	කොන්ත්‍රාත්තුව	ඇස්තමේන්තු මුදල (VAT රහිත රු.මි)	අවශ්‍ය CIDA ලියාපදංචිය	ලංසු සුරක්ෂණයේ වටිනාකම (රු.)	ලංසු සුරක්ෂණය වලංගු කාලය	ලංසු ලියවිලි ගාස්තුව (ආපසු නොගෙවන)	කොන්ත්‍රාත්තු කාල සීමාව
01	Soil Nailing, Construction of Retaining wall and Office`s Toilets at Doluwa Divisional Secretariat	13,424,340.12	C-7 & C - 6 & C - 5	135,000.00	දින 105 (2027.03.02)	3,500.00	දින 30
02	හල්ඔය සේවා පියස සහ ප්‍රජා ශාලාව ගොඩැගිල්ල ඉදිකිරීම	8,430,190.45	C-8 & C - 7 & C - 6	84,500.00	දින 105 (2027.03.02)	3,500.00	දින 30
03	ලෙවලන්වත්ත පිකොටස .කේ. පාලම ඉදිකිරීම	4,435,484.00	C-8 & C - 7 & C - 6	44,400.00	දින 77 (2027.02.02)	3,500.00	දින 30
04	ස්ටර්ලන්බර්ග් ඩිස්පෙන්සරිය අසල පාලම සංවර්ධනය කිරීම පුපුරුස්ස -	4,365,794.75	C-8 & C - 7 & C - 6	43,700.00	දින 77 (2027.02.02)	3,500.00	දින 30
05	Construction of New bridge at Bohappa road via Inguruwaththa Oya	5,064,106.50	C-8 & C - 7 & C - 6	50,700.00	දින 105 (2027.03.02)	3,500.00	දින 30

2. කොන්ත්‍රාත්තුව ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරු අසාඩු ලේඛණ ගත වී නොතිබිය යුතු අතර, CIDA ආයතනයේ ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය. මිල ගණන් සමඟ වලංගු CIDA ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

3. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2026.11.02 දින සිට 2026.11.16 දින දක්වා සෑම වැඩකරන දිනයකම පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ සරප් වෙත ආපසු නොගෙවන නියමිත ලංසු ලියවිලි ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය ගිණුම් අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් ලංසු ලියවිලි ලබා ගත හැකිය.

CamScanner

4. සම්පූර්ණ කරන ලද මිල ගණන් ලේඛන, BOQ, මිල උපලේඛන, CIDA සහතිකය, ලංසු සුරක්ෂණය / ඇපකරය සහ ලංසු ලියවිලි වල ඉල්ලා ඇති තාක්ෂණික, මූල්‍ය හා අනෙකුත් සුදුසුකම් සහිත ලේඛන වල සහතික කළ පිටපත් ලංසු සමඟ නිසි පරිදි අත්සන් කර මුද්‍රා තැබූ කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

5. පූර්ව ලංසු රැස්වීම (Pre-Bid Meeting) 2026.11.11 වන දින පෙ.ව. 10.00 ට දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වේ. මිල ගණන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන කොන්ත්‍රාත්කරුවන්ට මෙම රැස්වීමට සහභාගී වීමෙන් කාර්යයේ ස්වභාවය, පිරිවිතර, ප්‍රමාණයන්, ස්ථානීය තත්ත්වයන් සහ අනෙකුත් අවශ්‍යතා පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගත හැක.

6. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසුපත් පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා අනුපිටපත වෙන් වෙන්ව නම්කර මුද්‍රා තබා එක කවරයකට බහා 2026.11.17 වෙනි දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ දොළුව ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දොළුව යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ ගිණුම් අංශයේ ගණකාධිකාරි නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියකට බහාලීම කළ හැකිය. ලංසුපත් ඉදිරිපත් කරන කවරයේ ඉහළ වම් කෙළවර අදාල කොන්ත්‍රාත්තුවේ නම හා ලංසු අවසන් දිනය සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන මිල ගණන් භාරගනු නොලැබේ.

7. මිල ගණන් භාරගැනීම අවසන් වූ වහාම (2026.11.17 වෙනි දින ප.ව. 2.00 ට පසු) දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මිල ගණන් විවෘත කරනු ලැබේ. ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරුවන්ට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයන්ට සහභාගි විය හැකිය.

8. ලංසු විවෘත කිරීමේ දින (2026.11.17) සිට දින 77 ක කාලයක් උපලේඛනයේ සඳහන් පළමු,දෙවන හා පස්වන ව්‍යාපෘති සඳහා ලංසු වලංගු විය යුතු අතර අනෙකුත් ව්‍යාපෘති 02 සඳහා දින 49 ක කාලයක් ලංසු වලංගු විය යුතුය.

9. සෑම ලංසුවක්ම ලංසු සුරක්ෂණය (Bid Security) සමඟ ඉදිරිපත් කළ යුතුය.

10. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් ලබාගත්, ලංසු විවෘත කළ දින (2026.11.17) සිට උපලේඛනයේ සඳහන් වටිනාකමින් හා ලංසු සුරක්ෂණය වලංගු දිනය සහිත කොන්දේසි විරහිත ආපසු ගෙවන ලංසු සුරක්ෂණ සහතිකයක් හෝ දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් කරන ලද තැන්පත් කිරීමක් සඳහා වූ ලදුපත ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය. මෙම ලංසු සුරක්ෂණ දොළුව ප්‍රාදේශීය ලේකම් නමින් ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

ඩබ්.ජී.වයි.පී. දයාරත්න
ප්‍රසම්පාදන කමිටු සභාපති,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දොළුව

CamScanner